**භාරති එයාර්ටෙල් ලංකා 2019 ජාතික ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන දිනයි**

දහසය වන ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන උළෙලේදී වෙනත් සේවා සහ වෙනත් අංශ කාණ්ඩය යටතේ අනුශූරතාව දිනා ගැනීමට එයාර්ටෙල් ලංකා සමත් වූ අතර 2019 වසර සම්මාන උළෙලේ මෙවන් ඇගයීමකට ලක්වූ එකම දුරකථන සමාගම වන්නේද එයාර්ටෙල් ලංකා සමාගමයි.

මෑත කාලයේදී වඩාත් සම්මානනීය ආයතනයක් ලෙස පිළිගැනීමට ලක්වූ එයාර්ටෙල් ලංකා ගෙවුණු කාලය තුළ තවත් සම්මාන රැසකින් පිදුම් ලැබීමට සමත් විය.එහිදී "Great Place to Work" ආයතනය මගින් ශ්‍රී ලංකාවේ සේවය කළ හැකි හොඳම ආයතන 25 අතරටත්, ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා සේවය කල හැකි හොඳම ආයතන 10 අතර එකම දුරකථන සමාගම බවට ද එයාර්ටෙල් ලංකා සම්මානයට පාත්‍ර කරන ලදී. මීට සමගාමීව World HRD Congress ආයතනය මගින් පැවැත් වූ CMO සම්මාන උළෙලේදී 'Best Brand'" 'Best Employer Brand' සහ 'Best Innovation for Retention Strategy' යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීමට එයාර්ටෙල් සමත් විය.එසේම Colombo Leadership Academy සහ People Business India සහයෝගීත්වයෙන් සංවිධානය කළ සම්මාන උළෙලේදී ''Company with Great Managers" සම්මානය සමග තනි පුද්ගල විශිෂ්ට කළමණාකරු සම්මාන ත්‍රිත්වයක් ආයතනයෙහි කළමණාකරුවන් තිදෙනෙකු විසින් දිනාගැනීමට සමත් වී තිබේ.තවද ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය මගින් මෑතකදී පැවැත් වූ SLIM NASCO සම්මාන උළෙලේදී දුරකථන සන්නිවේදන කාණ්ඩයේ අලෙවි විධායක/සුපරීක්ෂක සහ කලාපීය කළමනාකරු යන අංශ යටතේ රන් සහ ලෝකඩ සම්මාන දිනා ගැනීමට එයාර්ටෙල් ලංකා සමත් වීම විශේෂත්වයකි.

එයාර්ටෙල් ලංකා තම කාර්ය මණ්ඩලය වෙනුවෙන් සක්‍රිය සහ නිර්මාණාත්මක සේවා පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් කරනු ලබන අඛණ්ඩ ආයෝජනයේ සැබෑ ප්‍රතිඵල මෙම ජයග්‍රහණය තුළින් පෙන්නුම් කරනු ලබයි.එසේම මෙතුළින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සේවා යෝජකයෙකු ලෙස ආයතනයේ සාර්ථකත්වය පිළිබිඹු කරන අතර සුවිශේෂී රැකියා අත්දැකීම් ලබා දෙමින් ව්‍යාපාරික විශිෂ්ටත්වය ද පෙන්නුම් කරනු ලබයි,

වර්ෂ 2004 දී ශ්‍රී ලංකාවේ ජාතික වාණිජ මණ්ඩලය විසින් ආරම්භ කරන ලද NBEA සම්මාන උළෙල ශ්‍රී ලංකාවේ අසමසම ආයතනික විශිෂ්ටත්වයේ කීර්තියක් පවත්වා ගෙන යන පුරෝගාමී සම්මාන උළෙලකි.

Image I :- වමේ සිට :ලක්මාල් රණසිංහ (මූල්‍ය),රුක්මල් වර්ණකුලසූරිය (අලෙවිකරණ)කුෂාණි අඹවත්ත(පාරිභෝගික සම්බන්ධතා)සුරංගි රාජපක්ෂ (ceo කාර්යාලය)කණිෂ්ක රණවීර(මානව සම්පත් ප්‍රධානි)ජිනේෂ් හෙජ්(ප්‍රධාන විධායක නිළධාරී/කළමණාකාර අධ්‍යක්ෂ)සුරේනි දයාරත්න විජේසිංහ(මානව සම්පත්),ෂාරා රාජගුරු (මානව සම්පත්)සචිනි පඬිකෝරල(මූල්‍ය)ෂෆියා කරීම් (අලෙවිකරණ)දුමිඳු තිලකරත්න (ජාලකරණ) සුහයිබ් බිෂ්රුල් (විකුණුම් )ඉෂාන් මල්වත්තගේ (විකුණුම්)